

# ලෝකාලෝකය

2024 ජූලි - සැප්තැම්බර් කලාපය

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහාගන්න,
එවිට නුඹ ගැළවෙන්නෙහිය. නුඹද නුඹේ ගෙදර අයද
එසේම ගැළවෙන්නේය
(ක්‍රියා 16:31)**

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901




# අසීමිත කරුණාව

ආදරණීය දුවලා පුතාලා වෙනුවෙන් අදත් මම ලස්සන පුංචි කථාවක් අරගෙන ආවා. එහෙමනම් මේ කථාව කියවලා බලන්නකෝ.

එක්තරා බැටළු එඬේරෙකුට තම බැටළු රැළේ බැටළුවන් සියයක් සිටියා. එඬේරෙක් කියන්නේ දුවේ පුතේ බැටළුවන් බලාගන්නා තැනැත්තාටයි. ඔන්න එක දවසක් ඔය රැළේ එක බැටළුවෙකු අඩු වී ඇති බව එඬේරාට තේරුනා ඉතින් මේ එඬේරා හොඳටම කළබල වුණා. එයාට ගොඩක් දුක හිතුනා. එයා මොකද කළේ දන්නවාද? ඉතිරි බැටළුවන් 99 දෙනාව ඉතා ආරක්ෂිතව තියලා නැති වුණ බැටළුවා සොයමින් ඇවිද්දා. කැළෑ පාරවල් දිගේ ඇවිදගෙන ගියා. කඳු නැග්ගා, සීතලේ ගැහෙමින් රෑ පුරා බැටළුවා සොයා ඇවිද්දා. ඔහු බැටළුවා සම්බවන තුරුම සොයලා බැටළුවාව සොයා ගත්තා.

අනේ ..... එඬේරාට ලොකු සතුටක් ඇති වුණා. ඔහු බැටළුවාව කරේ තබාගෙන ඉතාම ප්‍රීතියෙන් ගෙදර ගෙන ආවා. ඉතින් දුවලා පුතාලා දන්නවාද, මේ එඬේරා කරපු දේ. එයාගේ මිතුරන් තම නිවසට කැඳවලා තමාගේ නැති වූ බැටළුවා සම්බවූ නිසා ඔවුන් සමඟ ප්‍රීති වුණා. දුවේ පුතේ ඔයාලා දන්නවාද මේ උපමා කථාවේ එඬේරාට සමාන කරන්නේ කවුද කියලා. ඔව් ඒ තමයි ස්වාමී වූ යේසුස්වහන්සේ.

යේසුස්වහන්සේ තමයි අපේ යහපත් බැටළු එඬේරාණන්. ශුද්ධ බයිබලයේ **යොහාන් 10:11** සඳහන් ආකාරයට **"මම යහපත් බැටළු එඬේරාය. යහපත් බැටළු එඬේරා තමාගේ ජීවිතය බැටළුවන් උදෙසා දෙන්නේය"** යයි උන්වහන්සේ ගැන සඳහන් කරයි.



එතකොට දරුවනේ අර නැතිවුන බැටළුවාගෙන් අදහස් කරන්නේ කවුරු කියලද ඔයාලා හිතන්නේ, ඒ තමයි වැරදි වැඩ කරන අය, අකීකරු වන අය, සහ යේසුස්වහන්සේගේ ආදරයෙන් ඉවත්ව ගිය අය. බලන්න දුවේ පුතේ, යේසුස්වහන්සේ කැමති වුණේ නැහැ උන්වහන්සේගේ එකම බැටළුවෙක්වත් විනාශවෙලා යනවාට. අපි නොමග යනවාට උන්වහන්සේ කැමති නැහැ. මොකද අපි එක් එක්කෙනා උන්වහන්සේට ගොඩක් වටිනවා.

ඉතින් දරුවනේ අපිත් උන්වහන්සේගෙන් අහක්ව ගිය විට, උන්වහන්සේට අකීකරු වන විට අර එඬේරා නැති වුන බැටළුවා සොයා ගියාක් මෙන් යේසුස්වහන්සේත් පුංචි ඔයාලව සොයාගෙන එනවා. ඒ උන්වහන්සේගේ අසීමිත කරුණාව නිසයි. උන්වහන්සේ පුංචි ඔයාලව ආදරයෙන් උසුලාගෙන මහත් ප්‍රේමයෙන් ඔයාලව රැකගන්නවා.

ඉතින් පුංචි ඔයාලත් උන්වහන්සේට කීකරුව, යටහත්ව සිටිමින් උන්වහන්සේගේ අසීමිත කරුණාව, ආදරය අත්දකින්න. ඔයාලා සියලුදෙනාටම දෙවියන්වහන්සේ ආශිර්වාද කරන සේක්වා.

ආදර,

**- තබීතා නැන්දා -**

# 2024 ශුද්ධ සමුළුව

**"මක්නිසාද දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය, බලවත්ය, කොයිම දෙමුහත් කඩුවකටවත් වඩා තියුණුය, ප්‍රාණය හා ආත්මයද සන්ධි සහ ඇටමිඳුලුද වෙන් කරන තරමට කාවදින්නේය, සිතේ සිතුවිලිද අදහස් ද විමසන්නේය"**

**- හෙබ්‍රෙව් 4:12 -**



ප්‍රිය සහෝදර සහෝදරියනි,

ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඔබ සැමට ආචාර කරමි. 2024 ජූලි - සැප්තැම්බර් ලෝකාලෝක සඟරා කලාපය ඔබ අතට පත් කිරීමට දෙවියන්වහන්සේ දුන් කරුණාව හා මග පෙන්වීම ගැන පළමුව උන්වහන්සේට ස්තූති ප්‍රශංසා කරමි. දිනපතාම බයිබලය කියවා එය මෙනෙහිකරන මෙන් ඔබ සියලු දෙනාගෙන් ආයාචනා කරමි. මක්නිසාද අපගේ ආත්මයට ආහාර අවශ්‍යය. අපගේ ආත්මික ආහාරය වන්නේ දේව වචනයයි. ශුද්ධ බයිබලය කියවීම, මෙනෙහි කිරීම හා අධ්‍යනය කිරීම කරණකොටගෙන ආත්මය පෘෂ්ඨිමත් වනවා මෙන්ම තෘප්තිමත් ද වේ. ආත්මය වර්ධනය වන විට එහි බලපෑමෙන් අපගේ හදවත තුළ ප්‍රීතිය, සන්තෝෂය, බලාපොරොත්තු, ඇදහිල්ල වැනි ගුණාංග ජනිත වී ජීවිතය ජීවත් කිරීමට ජවයක් ලැබෙණු ඇතැයි මම සිතමි. දේව වචනය පරිහරණය කරන හා පරිශීලනය කරන අය වඩ වඩා දෙවියන්වහන්සේ පිළිබඳ ගැඹුරු කාරණා වලින් සන්නද්ධ වේ. එමඟින් ජීවිතයේ යථාර්තය හා මේ විශ්වයේ පැවැත්ම පිළිබඳ ඥානය ලබා ගනී. එමෙන්ම දෙවියන්වහන්සේගේ චරිතය හා උන්වහන්සේගේ හදවත දැන ගනියි. මේ ලෝකය පිළිබඳ උන්වහන්සේගේ සැලැස්ම හා කාලසටහන පිළිබඳ මනා අවබෝධයක් මෙන්ම සත්‍යය දැනුම ලබා ගනියි. මරණය, ස්වර්ගය, නිරය

වැනි අර්බුධකාරී මාතෘකා ගැන දිව්‍යමය පැහැදිලි කිරීම් ඉගෙන ගත හැක. මේ සා විශාල දැනුමක්, අවබෝධයක්, ඥාණයක් බයිබලය අධ්‍යනය කිරීම මඟින් ඕනෑම කෙනෙකුට ලබා ගත හැකි බවයි මාගේ විශ්වාසය. එහෙත් එක් කොන්දේසියකට යටත්වයි. එනම් ශුද්ධ බයිබලය ජීවමාන දෙවියන්වහන්සේගේ වචනය බවත් එහි ලියැවී ඇති සියල්ල සත්‍යය බවත් පුද්ගලිකව ඔබ සැකයක් නොමැතිව විශ්වාස කළයුතුව ඇත.

දේව වචනය ඉගෙන ගැනීමට ඔබටත්, මටත් මහඟු අවස්ථාවක් උදා වී ඇත. එනම් අප මධ්‍යස්ථානය මඟින් දීර්ඝ කාලයකට පසු සංවිධානය කර ඇති ශුද්ධ සමුළුවේදීය. **එය 2024 සැප්තැම්බර් මස 14,15,16,17 දින වලදී කොළඹ මෙතෝදිස්ත විද්‍යාලීයය ශ්‍රවනාග ාරයේදී පැවැත්වේ.** මේ දින හතරම සම්පූර්ණ නිවාඩු දවස් ය.

සැප්තැම්බර් 14 වැනි සෙනසුරාදා උදේ 8.00 ට සමුළුව ආරම්භ වන අතර 17 වැනි අඟහරුවාදා දිවා ආහාරයත් සමඟ සමුළුව අවසන් වේ. මෙය නේවාසික සමුළුවකි. එනම් දින හතරම අපි ආහාරපාන, නවාතැන් සහ අනෙකුත් පහසුකම් සපයන්නෙමු. දින හතර පුරාවටම දේව වචනය උගන්වන්නෙමු. ගායනා කිරීම් ඇතුළු යාච්ඤාව, නමස්කාරය, රොටි කැඩීම, සුභාරංචි පෙරහැර වැනි බොහෝ විශේෂාංග වලින් මෙම සමුළුව සමන්විතය. ඔබත් මෙම අවස්ථාවට සහභාගී වීමට කැමති නම් ලිඛිතව ලිපියක් මාර්ගයෙන් අපට දැනුම් දෙන්න. වැඩි විස්තර අවසාන පිටුවේ සඳහන් වී ඇත. ඔබ සැමට දෙවියන්වහන්සේ ආශිර්වාද කරන සේක්වා !

- සංස්කාරක -
**එස්. මෙත්තානන්ද**
**077 8813197**

# ක්‍රිස්තුස්වහන්සේගේ අසහායභාවය



ක්‍රිස්තුස්වහන්සේ යනු පදවි නාමයකි. ක්‍රිස්තුස්වහන්සේ යනු ආලේපලත් තැනැත්තාය. දෙවියන්වහන්සේ විසින් ක්‍රිස්තුස්වහන්සේව ආලේප කරනු ලැබූ සේක, වෙන් කරනු ලැබූ සේක, පත්කරනු ලැබූ සේක. ඒ මනුෂ්‍ය සංහතියේ පාපයේ වන්දි මිලය ගෙවා ඔවුන් පාපයෙන් හා නිරයෙන් ගලවා ගන්නා පිණිසය.

**"පව්කාරයන් ගලවන්නට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ලෝකයට ආසේක"** Christmas නොහොත් නත්තල යන්නෙහි තේරුම (**1 තිමෝති 1:15, 1 තිමෝති 2:5**) මෙයයි. මෙහි ඇති සත්‍යතාව ඔබේ හදවතින් හොඳින් සිතාබලන්න. එනම් **"ඇත්තේ එක දෙවියන්වහන්සේ සහ එම දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යයන් අතරේ ඇත්තේ එක මැදහත්කාරයෙක් වන ක්‍රිස්තුස්වහන්සේ පමණයි".**

**1 තිමෝති 3:15** හි සඳහන්ව ඇත්තේ මෙම අභිරහසයි. දෙවියන්වහන්සේ මනුසත් බව ගැනීමය. යේසුස්වහන්සේට භූමික පියෙක් සිටියේ නැත. ඒ නිසා උන්වහන්සේ අසහාය මිනිසාව සිටියේය. අදත් උන්වහන්සේ අසහාය තැනැන්වහන්සේය. යේසුස්වහන්සේගේ මෙලොවට පැමිණීම මනුෂ්‍ය ඉතිහාසය දෙකට වෙන් කරන ලදී. එනම් ක්‍රිස්තු පූර්ව හා ක්‍රිස්තු වර්ෂ ලෙසිනි. මෙම පුද්ගලයාගේ ඇති අසහායතාවය මේ මගින්ද ප්‍රදර්ශනය වේ.

ජීව විද්‍යාවේ ස්වභාවික නිතිරීති වලට පටහැනිව උපත ලැබීම, ගව මඩුවක ඉපදීම, දුප්පත්කම අතැතිව හැදී වැඩීම, "වඩුවාගේ පුතා" යයි කියනු ලැබීම, උන්වහන්සේම වඩු කර්මාන්තයෙහි යෙදීම, පාසලකට කවදාවත් ගියේද නැත. පොතක් කවදාවත් ලිව්වේද නැත. උන්වහන්සේගේ ඉපදුනු රටින් පිට කවදාවත් ගියේද නැත. උන්වහන්සේ වටා සිටි ලෝකයා උන්වහන්සේට විරුද්ධව සිට. "අශුද්ධ ආත්මයක් වැසී ඇතැ" යි ද, "කෑදර මනුෂ්‍යයන් කියා" ද ඔලුව අවුල් වූ විකාර වූ පුද්ගලයෙක් කියාද " බොරු කාරයෙක්" කියා ද අවලාද කරනු ලැබුවේය. වයස අවුරුදු 33 දී උන්වහන්සේ කර නොතිබු අපරාධ කියා පැමිණිලි කරනු ලැබ, මරණීය දණ්ඩනය නියම කරනු ලැබ, කුරුසිය මත මරණයට පත් කරනු ලැබීය. වෙනකෙනෙකුගෙන් ඉල්ලා ගත් සොහොනක තැන්පත් කරන ලදී.

මෙවැනි පුද්ගලයෙක්, ඉතිහාසයේ අමතක වී යා යුතුව තිබුණු නමුත් අද අනුගාමිකයන් මිලියන ගණනක් මොලොවේ සිටින්නේ කෙසේද? උන්වහන්සේ "දෙවියන්වහන්සේ" යයි විශ්වාස කරමින් උන්වහන්සේට වැඳ වැටෙන මිලියන ගණන් ජනතාවක් සිටින්නේ කෙසේද? යම් පුද්ගලයෙක් මෙලෙස පවසා ඇත. "මේ ලෝකයේ ගමන් කරපු, සියලුම හමුදාවන්, මේ මුහුදෙහි ගමන් කරපු සියලුම නාවික හමුදාවන්, රජකම් කලාවූ සියලුම රජවරුන්, බලය ලැබුවා වූ සියලුම පාර්ලිමේන්තු මේ හැමදෙනාම එකතු කර ගත්තත් මේ තනි මිනිසා මුලු පොළොවට ඇති කළ බලපෑම තරම් බලපෑමක් ඇති කරන්ට ඔවුන් අසමත් වී ඇත". එම නිසා අපගේ

සාමාන්‍ය අවබෝධය අනුව සැලකුවත් අපට පිළිගන්නට සිදුවෙනවා මේ තනි පුද්ගලයා, නාසරෙත් හී යේසුස්වහන්සේ අසහාය පුද්ගලයකු බව.

## මෙම අසහාය මිනිසා එනම්, යේසුස්වහන්සේව බයිබලයෙහි හඳුන්වන නාම කිහිපයක්,

- ★ උන්වහන්සේ අදෘශ්‍යමාන දෙවියන්වහන්සේගේ ස්වරූපය - (කොලොස්සි 1:15).
- ★ උන්වහන්සේ දෙවියන්වහන්සේය- (හෙබ්‍රෙව් 1:8).
- ★ මුලු මැවිල්ලෙහි කුලුදුලාණෝ ය - (කොලොස්සි 1:15).
- ★ මලවුන්ගෙන් නැවත නැගිටි කුලුදුලාණෝ ය - (කොලොස්සි 1:18).
- ★ දෙවියන්වහන්සේගේ පුත්‍රයා -(යොහාන් 3:16).
- ★ උන්වහන්සේ මනුෂ්‍යා පුත්‍රයාය -(මතෙව් 20:23).
- ★ දීප්තිමත් පහන් තාරකාව ය -(එළිදරව් 22:10).
- ★ උන්වහන්සේ ධර්මිෂ්ඨකමේ හිරුය - (මලාකී 4:2).
- ★ උන්වහන්සේ සේවකයාය (යෙසායා 52:13).
- ★ උන්වහන්සේ ස්වාමියාය (මතෙව් 8:19).
- ★ උන්වහන්සේ දුක්දන්නා වූ මනුෂ්‍යාය - (යෙසායා 53:3).
- ★ සමාදානයේ කුමාරයාය (යෙසායා 9:6).
- ★ දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝය - (යොහාන් 1:29).
- ★ යුදා ගෝත්‍රයේ සිංහයාය (එළිදරව් 5:5) එනම්, මනුෂ්‍යයා පාපයේ දම්වැල් වලින් මුදවන්ට උන්වහන්සේට පුලුවන්ය.
- ★ උන්වහන්සේ මැදහත්කාරයාය (1 යොහාන් 2:1).
- ★ උන්වහන්සේ විනිශ්චයකාරයාය (ක්‍රියා 10:42).
- ★ උන්වහන්සේ යහපත් එඬේරාය (යොහාන් 10:11).
- ★ මරන්නට ගෙන යනු ලැබූ බැටළුපැටවාණෝය (යෙසායා 53:7).
- ★ උන්වහන්සේ අප උදෙසා පාපය වූ තැනැත්තාය (2 කොරින්ති 5:21).
- ★ උන්වහන්සේ ජීවනදායක රොටිය (යොහාන් 6:35).
- ★ උන්වහන්සේ ජීවනදායක වතුර දෙන තැනත්තාය (යොහාන් 4:10).
- ★ උන්වහන්සේ පර්වතය, උල්පතයය (යොහාන්4:14).
- ★ වියලි බිමෙන් නැගුණාවූ අංකුරය (යෙසායා 53:2).
- ★ උන්වහන්සේ සැබෑ වූ මිදි වැලය (යොහාන් 15:3).
- ★ උන්වහන්සේ ගැලවුම්කරුවා වගේම අපගේ ඇදහිල්ලෙහි කතෘතුමා ය (යොහාන් 12:1).
- ★ උන්වහන්සේ අනාගතවාක්තෘතුමා වගේම උන්වහන්සේ රජතුමාය (එළිදරව් 17:14).
- ★ ශාරොන් හී රෝසමල උන්වහන්සේය - (සාලමොන්ගේ ගීතිකා 2:1).
- ★ අපූරු මන්ත්‍රීවරයාණෝය (යෙසායා 9:6).
- ★ ලෝකයේ ආලෝකය උන්වහන්සේය - (යොහාන් 8:12).
- ★ උන්වහන්සේ මාර්ගයද සැබෑව ද ජීවනයද වන තැනැන්වහන්සේ ය (යොහාන් 14:6).
- ★ උන්වහන්සේ එම්මානුවෙල්ය, දෙවියන්වහන්සේ අප සමඟය. (මතෙව් 1:22-23).
- ★ උන්වහන්සේට මරණයේ ද නිරයේ ද යතුරු ඇත්තේය (එළිදරව් 1:18).
- ★ උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම ද ජීවනයද වන තැනැන්වහන්සේය (යොහාන් 11:26).

මෙම තැනැන්වහන්සේවම අපි සමරමු. උන්වහන්සේට නමස්කාර කරමු. උන්වහන්සේට සේවය කරමු. උන්වහන්සේ උදෙසා ජීවත් වෙමු. උන්වහන්සේ පිළිබඳ තව තව දැනගනිමු.

**(දේශනාවක් ඇසුරෙන් සකස් කළේ අමන්දි)**

# යේසුස්වහන්සේම ගොස් හමු වූ සමාරියේ ස්ත්‍රිය
## - (යොහාන් 4: 1-42) -

අපගේ ස්වාමී වූ යේසුස්වහන්සේ ජීවිතය හා සේවය පිළිබඳ ගැඹුරින් අධ්‍යනය කරන විට, බොහෝ ආකාරයේ අලුත් කරුණු එළිදරව් වෙයි. අප දිනපතාම පිළිවෙලකට බයිබලය කියවන විට ශුද්ධාත්මයාණන්වහන්සේ මීට පෙර අප නොදත් කාරණා එළිදරව් කරන සේක. **මතෙව්, මාර්ක්, ලූක් හා යොහාන්** පොත් ඉතා සංයමයකින් යුතුව ඔබත් පරිහරණය හා පරිශීලයනය කර යේසුස්වහන්සේගේ ජීවිතයේ හා සේවයේ ඉතා සියුම් කාරණා එළිදරව් කර ගන්න උත්සහ කරන මෙන් මම යෝජනා කරමි. ඒ අතර මෙවර මා සලකා බැලීමට උත්සුක වූයේ, යේසුස්වහන්සේ තමන් සිත තුල තිබූ අභිප්‍රායන් හා අරමුණු පෙර දැරි කරගෙන හමුවූ පුද්ගලයන්, ස්ත්‍රීන් හා ගමන් බිමන් පිළිබඳවය.

**යොහාන් 4** වැනි පරිච්ඡේදය හිමින් සීරුවේ තුන් හතර වතාවක් ඔබත් කියවන්න. **යොහාන් 4:3** පදයට අනුව යේසුස්වහන්සේ ඒ වන විට වැඩ සිටියේ යූදයේය. එහෙත් හදිස්සියේම උන්වහන්සේ ගලීලය බලා පිටත් විය. එහෙත් 4 පදයට එන විට මෙසේ සඳහන් වේ. **"උන්වහන්සේට සමාරිය මැදින් ගලීලයට යන්න ඕනෑ විය"**. එනම් උන්වහන්සේ හිතාමතාම සමාරියට යන්න අදහස් කළ අතර එහි තිබූ සිඛාර් නුවරට උන්වහන්සේ පැමිණි සේක. එපමණක් නොව එහි තිබූ ළිඳක්



සොයාගෙන ගොස් එහි වාඩි විය. මේ වන විට වේලාව මද්‍යහන දොළහා පමණය. තවද තම ගෝලයන් කෑම රැගෙන එන පිණිස නගරයට පිටත් කර හැරිය උන්වහන්සේ එහි තනියම රැඳී සිටිසේක.

මෙම සිදුවීම් සියල්ල සසඳා බැලීමේදී එහි යම් සැලසුමක් හා අරමුණක් තිබූ බව අපට පෙනෙයි. දවල් 12.00 ළිදක් ලග යේසුස්වහන්සේ තනියම සිටීම සැකය දනවන අහඹු සිදුවීමකි. උන්වහන්සේ මෙහි සිටින්නේ ඇයි? ළිදට වතුර රැගෙන යන්න එන ස්ත්‍රියක මුණගැසීම උදෙසාය. උන්වහන්සේ ඇය මුණගැසෙන්නේ ඇයි? මේ ස්ත්‍රිය කවුද? අප ඇගේ නම නොදන්නෙමු. ඇය අවිවාහකය නමුත් පුරුෂයන් 5 දෙනෙකු සමඟ එකට ජීවත් වී ඇත. මද්‍යහන 12.00ට ලිඳට පැමිණියේ අන් අය ඒ වේලාවට නොපැමිණෙන නිසා විය හැක. එනම්, ඇය සමාජයේ අය ගෙන් සැඟවී ජීවත් වනවා විය හැක. බැලූ බැල්මට ඇයට හොඳ චරිතයක් නොමැති බවයි හැගෙ

න්නේ. නමුත් ස්වාමින්වහන්සේ ඇය සොයාගෙන පැමිණ ඇත. උන්වහන්සේ ඇය සමඟ කතා බහ ආරම්භ කරමින්, ඇගෙන් වතුර ඉල්ලා සිටී. ඉන්පසු, ලිඳ පිළිබඳව සහ වතුර පිළිබදව සංවාදය අවසන් විය. ඒ සමඟ උන්වහන්සේ ඇයට පවසනවා, ගොස් තම ස්වාමි පුරුෂයා කැඳවාගෙන එන ලෙස, තමාට ස්වාමි පුරුෂයෙකු නැති බව ඇය උන්වහන්සේට සත්‍යය පැවසුවාය. එවිට උන්වහන්සේ ඇයගේ ජීවිතය පිළිබඳ මුළු විස්තරය ඇයට පැවසූසේක. ඒ මගින් ඇය යේසුස්වහන්සේ අනාගතවාතෘ කෙනෙකු ලෙස හඳුනාගනියි. ඉන්පසු දෙවියන්වහන්සේට නමස්කාර කිරීම පිළිබඳව යේසුස්වහන්සේ සමඟ සංවාදයකට ඇය එළඹෙයි. එහිදී මේ ස්ත්‍රියට නමස්කාරය පිළිබඳ ඉතාම ගැඹුරු ආත්මික කාරණා උන්වහන්සේ ඉගැන්වූ සේක. මේ කාරණා තම ගෝලයන්ට පවා උන්වහන්සේ උගන්වා තිබුණේ නැත. එබැවින් මෙම හමුවීම සුවිශේෂය. දෙවියන්වහන්සේට නමස්කාර කිරීම පිළිබඳ අලුත් කාරණා ඉගෙනගත් මේ ස්ත්‍රිය හදිස්සියේම වෙනත් ආකාර හැසිරීම් රටාවක් පෙන්නුම් කරයි. ඇය වහාම ගමට ගොස් යේසුස්වහන්සේ පිළිබඳව ගමේ මිනිසුන්ට පවසා ඔවුන් උන්වහන්සේ සිටි තැනට කැඳවාගෙන පැමිණෙයි. පුදුම විපර්යාසයකි, වෙනසකි, මක්නිසාද මෙතෙක් සමාජයෙන් සැගවී සිටි මේ කාන්තාව දැන් මිනිසුන් සොයාගෙන ගොස් ඔවුන්ට සුභාරංචිය එනම් යේසුස්වහන්සේ පිළිබඳ ආරංචිය පවසයි. යේසුස්වහන්සේ කෙරෙහි එදින බොහෝ දෙනෙකු අදහාගනියි. හාස්කර්මයක් සිදුවී ඇත. නරක චරිතයක් වෙනස් වී ඇත. අපවිත්‍ර ජීවිතයක් දෙවියන්වහන්සේගේ සේවිකාවක් බවට පත් වී ඇත. යේසුස්වහන්සේගේ අභිප්‍රාය හා අරමුණ ඉටු වී මල්ඵල ගැන්වී ඇත. මෙය යේසුස්වහන්සේගේ බලයයි. මෙහිදී සිදුවූ දේ මනුෂ්‍යය බුද්ධියට තේරුම්ගත නොහැකි නමුත් ආත්මික මනසට එය වැටහෙයි.

ඔබගේත්, මගේත් ජීවිතය වෙනස් කර ගැනීමට අවශ්‍යය නම් යේසුස්වහන්සේව හමුවෙන්න. ඔබටත් මටත් උන්වහන්සේ ප්‍රේම කරන සේක. අප සොයාගෙන උන්වහන්සේ පැමිණ ඇත. උන්වහන්සේට සවන්දෙන්න. උන්වහන්සේව විශ්වාස කරන්න. **"වෙහෙසවෙන බර උසුලන සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා" (මතෙව් 11:28**) යයි යේසුස්වහන්සේ අප කැඳවන සේක. ජීවිතයේ ඕනෑම ප්‍රශ්ණයක්, කරදරයක්, අසනීපයක් හෝ වෙනත් බරක් නිසා අප දුක්විදින විට එකම සැබෑ පිහිට උන්වහන්සේය. ජිවිතයට බලාපොරොත්තුවක් නැති විට අපගේ බලාපොරොත්තුව යේසුස්වහන්සේය. ජීවිත වෙනසක් අවශ්‍ය වූ විට අපගේ ඇතුලාන්තය වෙනස් කළ හැක්කේ යේසුස්වහන්සේට පමණි. මරණ බිය දැනෙන විට නිසැක සහතිකභාවය මළවුන්ගෙන් නැගිටුණ යේසුස්වහන්සේය. උන්වහන්සේ අපගේ සදාකාලික එඬේරාය. සමාරියේ ස්ත්‍රියගේ ජීවිතය පරිවර්තනය කළ ඇගේ ජීවිතයේ විපර්යාසයක් සිදුකල යේසුස්වහන්සේ මේ දැනුත් ඔබ මා ළගය. **"යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහාගනින්න. එවිට නුඹ ගැලවෙන්නෙහිය" (ක්‍රියා 16:31**).

**- ජීවන හඬ -**

# මාර්තාගේ චරිතාපදානය

ස්වාමිවූ යේසුස්වහන්සේ මොලොව ජීවත්වූ කාලයේදී කීහිපවිටක්ම බෙතානිය නම් ගමට ගිය බව ශුභාරංචි පොත්වල සඳහන් වේ. ලාසරුස්, මාර්තා සහ මරියා ජීවත්වූයේ එම ගමෙහිය. පළමුවතාවට උන්වහන්සේ එම ගමට පිවිසි විට උන්වහන්සේව තම නිවසට පිළිගත්තේ මාර්තාය. ඇය අපට ශුද්ධ බයිබලයේ හමුවන කැපීපෙනෙන චරිතයකි. අප දන්නා පරිදි ඇගේ සොහොයුරිය වන බෙතානියේ මරියා පිළිබඳව යහපත් කාරණා කතාබහට ලක්වන නමුත්, මෙම මාර්තා ගැන වැඩියමක් අප අතරේ නොපැවසේ. එනමුත් අදාල දේව වචන කොටස් කියවා බැලීමෙන් ඈ ගැනත් අගනා දෑ අපට උගත හැක. මාර්තා අපට ශුද්ධ වූ බයිබලයේ තුන් වතාවක් මුණගැසේ. ඒ, **ලූක් 10:38-42, යොහාන් 11:1-44 සහ යොහාන් 12:2 හීය.** පොදුවේ ගත් කල ඈ ප්‍රායෝගික සේවය පිළිබඳ හොඳ උදාහරණයකි. බොහෝවිට ස්ත්‍රීන්ගේ වැඩි කැමැත්ත වන්නේ දේශනා ඇසීම, දේව වචනය ඉගෙන ගැනීම, යාච්ඤා සහ නමස්කාරය යන දෑ වලටයි. එහෙත් මාර්තා එසේ නොව, ප්‍රායෝගිකව තම ශ්‍රමය වැය කොට සේවය කරන්නට කැප වූවාය. එසේම ඇය ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝල ස්ත්‍රියක් ලෙසද සැබවින්ම ගණන් ගත හැක. ඇය පිළිබඳව කැපීපෙනෙන කරුණු 5ක් සංක්ෂිප්ත ලෙස පහතින් සඳහන් කරමි.

## 01. ප්‍රේමණීය උපස්ථානය

**ලූක් 10:38** හී ඈ පළමුවතාවට යේසුස්වහන්සේ මුණගැසුණු අවස්ථාව සඳහන් වේ. ඈ එකෙනෙහිම යේසුස්වහන්සේට තම නිවසට ආරාධනා කළාය. සමහරවිට යේසුස්වහන්සේගේ කීර්තිය, උන්වහන්සේ කර තිබූ හාස්කම් සහ උන්වහන්සේගේ අසහාය ඉගැන්වීම් ඈ කලින් අසා තිබුණා විය හැක. යේසුස්වහන්සේව තම නිවසට පිළිගත් ඇය උන්වහන්සේට උපස්ථාන කිරීමට වෙහෙස වූ ආකාරය **ලූක් 10:40** හී අපි කියවමු. උන්වහන්සේ ඇගේ නිවසට ගියේ තනිවම නොව, තම ගෝලයන් සහ තවත් පිරිසක් කැටුව බව පැහැදිලිය. එවැනි කණ්ඩායමකට උපස්ථාන කිරීම හා ආගන්තුක සත්කාර කිරීම පහසු කාර්යයක් නොවේ. ඊශ්‍රායෙල් චාරිත්‍ර වලට අනුව ඒ සැමදෙනාගේ පාද සේදීම, පිස දැමීම, බීමට වතුර දීම වගේම කෑම පිළියෙල කිරීම, කෑම බෙදා දීමට භාජන සකස් කිරීම වැනි නොයෙකුත් කාරණාවල නියැලීමට සිදුවේ. ඈ තම මුලු සිතින් ඒ දෑ කළාය. මෙය අපටද අභියෝගයකි. යේසුස්වහන්සේට මෙන්ම උන්වහන්සේගේ ගෝලයන්ටත් ආගන්තුක සත්කාරයෙන් සැලකීමට දෙවියන්වහන්සේ ඔබත් මාත් කැඳවා තිබේ.

## 02 වෙනස් නොවන භක්තියාදරය

**ලූක් 10** වැනි පරිච්ඡේදයේ සඳහන් මාර්තා හා මරියා සම්බන්ධ සිද්ධියේදී, "

මැය මා තනියම මෙහෙ කරන්ට හැරියා" යැයි ද යේසුස්වහන්සේට පැමිණිලි කල අවස්ථාවේ ඇයට යේසුස්වහන්සේගෙන් ලැබුණු පිළිතුර ඇය බලාපොරොත්තු වූ ආකාරයේ එකක් වූයේ නැත."ඔබ බොහෝ දේවල් ගැන කරදර වන්නේ " යැයි ද "මරියා වඩා යහපත් කොටස තෝරාගත්තා" යැයි ද , යේසුස්වහන්සේ පැවසූ විට ඇගේ සිත තුල අමනාපයක් හටගන්නට හොඳටම ඉඩකඩ තිබුණි. එහෙත් **යොහාන් 11** වැනි පරිච්ඡේදයේහි යලි යේසුස්වහන්සේ බෙතානියට පැමිණිය විට වහා උන්වහන්සේ මුණගැසීමට පිටත්ව යාමෙන් උන්වහන්සේ කෙරෙහි ඇති භක්ත්‍යාදරයේ කිසි වෙනසක් සිදු වී නැති බව ඇය පෙන්වූවාය. තම සොයුරා මරණයට පත්වී දින 4ක් ගත වී තිබුණද යේසුස්වහන්සේගේ ප්‍රමාදය ගැන ඇය උරණවූ බවක් පෙනෙන්නට තිබුනේද නැත. මෙය අප ඇගෙන් උගත යුතු ඉතා වටිනා පාඩමකි. බොහෝ ඇදහිලිවතුන් තමන්ගේ යාච්ඥාවට දෙවියන්වහන්සේගේ පිළිතුරු දීමේ ප්‍රමාදය නිසා සිත යට යම් අමනාප ගතියක් ඇති කර ගන්නා අයුරු අප දැක තිබේ. එහෙත් ඇය එවැනි තැනැත්තියක් නොවූවාය. දෙවියන්වහන්සේගේ යහපත්කම ගැන විශ්වාසකොට නොසැලෙන භක්ත්‍යාදරයක් ඇතුව සිටීම අප සැමදෙන තුළ තිබිය යුතු උතුම් ආත්මික ගුණාංගයකි.

## 03. අව්‍යාජ ඇදහිල්ල

මාර්තාගෙන් අප ලබන තවත් මහඟු ආදර්ශයක් නම් යේසුස්වහන්සේ කෙරෙහි ඈ තුල තිබූ අව්‍යාජ ළමා ආකාර ඇදහිල්ලයි. මේ වනවිටත් තම සහෝදරයා මරණයට පත්වී සතර දිනක් ගතවී තිබුනද යේසුස්වහන්සේ මුණගැසුණු විගස ඈ ප්‍රකාශ කල වචන **යොහාන් 11:21** හී මෙසේ දක්වා ඇත. **"දැනුත් ඔබ දෙවියන්වහන්සේගෙන් යමක් ඉල්ලන්නේනම්, ඒක දෙවියන්වහන්සේ ඔබට දෙන බව දනිමි"** ඇයගේ මෙම ප්‍රකාශය ඇසුණු සෙසු අයට කුමක් සිතෙන්නට ඇත්ද? දින 4කට පසු මළමිනියක් යලි නැගුටුවන්නට ඇය යෝජනා කරන බව ඔවුන්ට මෙන්ම අපටත් පැහැදිලිය. ළමා ආකාර අව්‍යාජ ඇදහිල්ල යේසුස්වහන්සේ ඉහලින් අගය කරන බව පෙන්වමින් උන්වහන්සේ ඇය කී පරිදිම ඇගේ සොයුරා මළවුන්ගෙන් නැවත නැගිටවූසේක.

## 04. නිරවුල් අවබෝධය

මාර්තා නැවත නැගිටීම ගැන අවබෝධයක් ඇතිව එය විශ්වාස කල තැනැත්තියක් බව යේසුස්වහන්සේ සමඟ ඇය කළ සංවාදය මගින් අපට පෙනීයයි. "නුඹේ සහෝදරයා නැවත නැගිටින්නේය"යි යේසුස්වහන්සේ පැවසූ විට ඇය එය බව දන්නා වග ප්‍රකාශ කලාය (**යොහාන් 10:24**). එම අවස්ථාවේ යේසුස්වහන්සේ නැවත නැගිටීම ගැන ඇයට වඩා අවබෝධයක් ලබාදෙන පිණිස, තමන්වහන්සේ ගැන වැදගත් සත්‍යතාවයක් එළිදරව් කලසේක. **"නැවත නැගිටීමද ජීවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නමුත් ජීවත්වන්නේය" (යොහාන් 11:25)**. උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන අය, ශාරීරිකව මරණයට පත්වූවත් උන්වහන්සේ කරණකොටගෙන

නැවත නැගිට සදාකාලයටම ජීවත්වන බව මාර්තාට සහතික කළසේක. **යොහාන් 11:27** පදයට අනුව මාර්තා ඒ බව විශ්වාස කරන බවත්, ඊටත් වඩා උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍ර වූ ක්‍රිස්තුස් නොහොත් මෙසියස් බව විශ්වාස කරගන සිටින බවත් ප්‍රකාශ කලාය. යේසුස්වහන්සේ ගැන මෙවැනි ප්‍රකාශයක් මීට පෙර කරන ලද්දේ පේතෘස් විසින්ය. එම එළිදරව්ව ඔහුට ලැබුණේ ස්වර්ගික පියාණන්වහන්සේගෙන් බව යේසුස්වහන්සේ පේතෘස්ට කීසේක **(මතෙව් 16:16,17)**. එවැනි මහත් එළිදරව්වක් සහ අවබෝධයක් මාර්තාටද ලැබී තිබීම විශේෂත්වයකි. වර්තමාන දේව ධර්මාචාර්යවරුන්ට වඩා මරණය සහ නැවත නැගිටීම පිළිබඳව සුපැහැදිලි අවබෝධයක් ඇයට තිබූ බව අපට පෙනේ. යේසුස්වහන්සේගේ කුරුසිය පාමුල මාර්තා සිටිය බවට සඳහනක්ද නැත්තේ උන්වහන්සේ තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින බව ඇය දැන සිටි නිසායැයි යෝජනා කරන්නට මට සිතේ.

## 05 නිම නොවන මෙහෙවර

**යොහාන් 12 වන පරිච්ඡේදයේ 1-3** දක්වා සඳහන් වන පරිදි අවසාන වරට අප මාර්තා දකින්නේත් උපස්ථාන කිරීමේ සේවයේ යෙදී සිටින්නියක් හැටියටයි. මෙවර නිවසට පැමිණ සිටි සංඛ්‍යාව පෙරටත් වඩා අධික බව අපට තේරුම්ගත හැක. එහෙත් දැන් ඈ තම සොයුරිය ගැන පැමිණිලි කරනු වෙනුවට යේසුස්වහන්සේ හා පැමිණි සිටි පිරිසට ආහාරපාන සපයාදීමේ කටයුතුවල



නියැලී සිටි බව සඳහන් වේ. මෙවන් සේවයන්හි යෙදෙන සහෝදරියෝ අදද අප අතරෙහි වෙති.

අවසාන වශයෙන් ඔබටත් මටත් සිතා බැලීමට කරුණක් සඳහන් කරමි. මාර්තා පිළිබඳ ශු. බයිබලයේ ලියැවී ඇති කරුණු සළකා බැලූවිට අපට අනුමාන කළහැක්කේ ඇය අවිවාහක කාන්තාවක් බවයි. අවිවාහක බව අභාග්‍යසම්පන්න අවාසනාවක් සේ සළකන අද වැනි සමාජයකට ඇය තියුණු පණිවුඩයක් ගෙන එයි. ස්වාමීවූ යේසුස්වහන්සේට මෙහෙකිරීමේ ප්‍රීතිය අන් සියලු සතුටට වඩා තෘප්තිකර බව ඇය අපට උගන්වන වැදගත්ම පණිවුඩයයි.

**- ඈන් ජයසුන්දර -**

# මිනිසාට නැවැත්විය නොහැකි මරණය



ලෝකයේ ජීවත්වන සෑම කෙනෙක්ම නිසැකවම දන්නා කරුණක් තිබේ. එනම් තමා යම් දවසක මරණයට පත්වෙන බවයි. කිසිවෙක් ඊට ආශා නොකරති. සිතීම පවා සමහරකු භීතියට පමුණුවයි. මම මැරෙන්ට බය නොවෙමියි සමහරෙක් පවසතත් යටි සිත එය ප්‍රිය නොකරයි. හදවතට හදවත් බද්ධකිරීමට තරම් මිනිසා තම ඥානය දියුණු කරගෙන ඇත. එහෙත් මරණය නතර කිරීමට සමතෙක් මේ පොළොවෙහි සිටීද?

**"ඔහු තමාගේ මව් කුසෙන් නික්ම ආ ලෙසම නිර්වස්ත්‍රව නැවත යන්නේය. තමාගේ අතින් ගෙනගිය හැකි කිසිවකුත් .... ඔහු ගෙනයන්නේ නැත" (දේශනාකාරය 5:15) "මක්නිසාද මනුෂ්‍යයා තමාගේ සදාකාල ගෙට හැරී යන්නේය" (දේශනාකාරයා 12:5).**

## ඔබේ සදාකාල නිවාසය කොතැනද?

අලංකාර ලෙස ගොඩනැගූ නිවාස පිළිබඳ දැන්වීම් ඔබ දිනපතා පුවත් පත්වල දකිනවා ඇත. ඔබට නිවසක් නැත්නම් හෝ තිබෙන එක අබලන්වී නම් ඒ ලස්සන නිවාසයක් අයිතිකර ගැනීමේ ආශාවක් ඔබ තුළට පිවිසෙනවා ඇත. නමුත් ඒ සඳහා රුපියල් මිලියන කීපයක් වැයකළ යුතුව තිබේ. කොපමණ වටිනා වුවද සියල්ල තාවකාලිකයි. නොමිලයේ ලබා ගත හැකි සදාකාලික නිවාසයක හිමිකරුවීමේ මාර්ගයක් තිබෙන බව මා සඳහන් කරන විට ඔබ මවිතවන්නට පුලුවනි. එය සත්‍යයකි. මා එය සත්‍යයක් යයි පවසන්නේ ශු. බයිබලය එසේ සඳහන් කරන නිසායි. මන්ද ශුද්ධ බයිබලය යනු දෙවියන්වහන්සේගේ පොතයි. එහි ලියැවූ සියල්ල සත්‍ය බවට විද්‍යාඥයෝ පවා පිළිගනිති. ඊට බොහෝ ඔප්පු සාක්ෂි තිබේ.

**"මාගේ පියාණන්වහන්සේගේ ගෘහයෙහි (ස්වර්ගයේ) බොහෝ වාසස්ථාන තිබේ. එසේ නොවූයේ නම් මා විසින් නුඹලාට දන්වනවා ඇත" යේසුස්වහන්සේ කී සේක (යොහාන් 14:6).**

මරණය ගැන නම් අපට නිසැකය. මරණින් පසු ජීවිතයක් තිබෙන බව අපට සැකසහිත විය හැකිය. ස්වර්ගයත්, නිරයත් මේ පොළොවම යයි සමහරු කල්පනා කරති. එය සිතුවිල්ලක් පමණි. පොළොවේ සාතන්ගේ ආත්මය ක්‍රියාකරන

බැවින් එය නිරයේ ස්වරූපයක් ගන්නාක් මෙන් පෙනෙනවා ඇත. එහෙත් පොළව නිරය නොවේ. එහෙත් ස්වර්ගය හා නිරය නම් සදාකාලික නිශ්චිත ස්ථාන දෙකකි. එකිනෙකින් වෙන්ව විශාල පරතරයකින් පිහිටා ඇත. (**ලූක් 16:16**).

දේශනාකාරයා අපට මේ අනතුරු හැඟවීම ගෙනඑයි. **"දූවිල්ල තිබුණ හැටියට ශරීරය පොළොවට හැරියන්ටත්, ආත්මය ඒක දුන් දෙවියන්වහන්සේ වෙතට හැරී යන්ටත් පළමුවෙන් උන්වහන්සේ සිහිකරන්න" (දේශනාකාරයා12:7).** මනුෂ්‍ය යෙකුගේ මරණයේදී ඔහුගේ ශරීරයෙන් ආත්මය වෙන්වේ. දැනීම, දැකීම, හැඟීම ජීවනය සියල්ලෙන් පූර්ණ ආත්මය ඉහත කී ස්ථාන දෙකෙන් එකකට ඇතුල්වීමට නියමිතය. ස්වර්ග රාජ්‍යයද නිරයද. තෝරාගැනීම පවතින්නේ ජීවත්ව සිටින කාලයේදීමය. එසේම එය පෞද්ගලික තීරණයක්ද වන්නේය.

ඔබ අතරින් කිසිවෙකු නිරයට යන්නට ආශානොවනවා ඇත. එය පව්කාරයින් සඳහා වෙන්ව ඇත. ස්වර්ගයට ඇතුල්වීමේ අවසර තිබෙන්නේ ශුද්ධවන්තයින්ට පමණි. එකම පාපයක්වත් නොකළ පව්කාර ස්වභාවයෙන් තොර කෙනෙකුට හෝ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පව්කමාව ලබා සිටින කෙනෙකුට ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීමට අවස්ථාව තිබේ. පාපයේ කිලිටු බවින් තොරව මෙලොව ජීවත් වූ එකම තැනැත්තා යේසුස්වහන්සේ පමණයි. එතුමා මිනිස් ස්වභාවය ගෙන ලොව බිහිවූ එකම වූ දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේ මිනිස් ස්වභාවය ගෙන මෙලොව බිහිවුණේ ඇයි? එකම අරමුණ මනුෂ්‍යයාට පවින් මිදීම ලබාදී ස්වර්ග රාජ්‍යයට සුදුසුකම ලබාදීමයි. පාපයට දඬුවම නම් මරණයයි. **"පාපයේ කුලිය නම් මරණයයි" (රෝම 6:23).** මේ අනුව පව්කරන සියල්ලෝම මරණීය දණ්ඩනය ලැබිය යුත්තාහ. දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඔබවත් මාවත් එම අවාසානවන්ත දඬුවමින් එනම් සදාකාලික නිරයෙන් මුදාගැනීමට ඉදිරිපත්වෙයි. එය සිදුවූයේ කෙසේද? යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපේ පාපයේ මිලය, වන්දිය, සිය ජීවිතයෙන් ගෙවා නිමකළසේක. එය මහා පුදුම ප්‍රේමයක් නොවේද? සැබවින්ම ඒ මහා ශ්‍රේෂ්ඨ ජීවිත පරිත්‍යාගය එදා කල්වාරි කන්ද මතුයෙහි කුරුසිය පිටදී සිදුවිය.

සෑම මනුෂ්‍යයෙකුම පාපයේ බීජය උපතින්ම උරුමව සිටී. සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති (**රෝම 3:23**). ඔබ කුඩා දරුවන් පවා කේන්ති ගන්නවා දැක තිබේ. මෙම පාප බීජය රහිතව ලොව බිහිවූ එකම මනුෂ්‍යයා යේසුස්වහන්සේ පමණයි. එමනිසා පව්කාර ලෝකය වෙනුවෙන් ජීවිතය පිදීමට හැකි එකම සුදුස්සා ද එතුමා පමණයි. කල්වාරි කන්ද මුදුනත ඒ පව් රහිත එකම මිනිසා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලී කුරුසියක් මත දිවි දුන්සේක. දිව්‍ය සැලැස්ම එසේ විය. අවශ්‍ය නම් තම දිව්‍ය බලය පාවිච්චිකර එම මරණයෙන් ඉවත්වීමට උන්වහන්සේට පුලුවන්කම තිබුණි. **" කිසිවෙකු ඒක මාගෙන් ගන්නවා නොව, මමම ඒක දෙමි" (යොහාන් 10:18).**

යේසුස්වහන්සේ කුරුසියේ දිවි පිදීමෙන්ම එය කෙළවර නොවීය. එතුමා මරණය පරාජයකර නැගුටුවණසේක. පන්සියයකට වැඩි ගණනකට ප්‍රකාශවූසේක. දින 40කට පසු ගෝලයන් බලාසිටිය දීම ස්වර්ගයට නැගුණසේක **(ක්‍රියා 1:9), (1 කොරින්ති 15:3-9).** අදත් උන්වහන්සේ ස්වර්ග රාජ්‍යයෙහි ශරීරයෙන් යුක්තව වැඩවසන්නාහ, ආත්මයෙන් ඇදහිලිවන්තයින් තුළ ප්‍රකාශ වන්නාහ. ස්වර්ග රාජ්‍යයට ඇතුලුවන මාර්ගය කුමක්ද? **"මාර්ගයද, සැබෑවද, ජීවනයද, මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත"** යේසුස්වහන්සේ **(යොහාන් 14:6)** පැවසූ සේක.

යේසුස්වහන්සේ සිය අමිල වූ පිරිසිදු වූ, පාප කිලුටක් නැති අනර්ඝ ලෙයින් මිලය ගෙවා ඔබගේ ස්වර්ගයට ඇතුල්වන විසා බලපත්‍රය ලබාගෙන ඇත. ගුවන් බලපත්‍රය ලබාගෙන තිබේ. ඔබට තිබෙන්නේ තවත් බලා නොසිට උන්වහන්සේ වෙත ගොස් එම තිළිනය පිළිගැනීමයි. ඒ සඳහා ඔබට කරන්නට තිබෙන දේ ඉතාම සුලුයි. එසේම ඉතාම වැදගත් ද වේ.

පළමුව ඔබ තුළ පාප බීජය, පව්කාර ස්වභාවය පවතින බව ඔබම බව පිළිග න්න. දෙවනුව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබව පවින් හා නිරයෙන් ගළවාගැනීමට තම නිර්මල ජීවිතය පූජා කළ බවත්, මරණය පරාජය කර නැගිටුණ බවත්, අදත් ජීවමානව වැඩසිටින බවත් පිළිග න්න. දැන් යේසුස්වහන්සේ ආත්මයෙන් ඔබ ඉදිරියේ සිටින බව සිතට ගෙන මේ වාගේ සරල යාච්ඤාවක් කරන්න.

**"ප්‍රේමණීය යේසුස්වහන්ස, පව්කාරවූ මට කරුණාකල මැනවි, ඔබවහන්සේ මට පාපයෙන් කමාව දී, ස්වර්ගය අයිතිකර දීමට දිවි පිදූ බවත්, මරණින් නැගිට ජීවමානව වැඩ සිටින බවත් අදහන්නෙමි. ඔබවහන්සේ මගේ එකම ගැලවුම්කාරයානන් ලෙස අදහා ගනිමි. මගේ පව් සිත සෝදා මේ මොහොතේම මා තුලට වැඩිය මැනව ආමේන්".**

ඔබ අවංකව මේ තීරණය ගත්තා නම් අපට ලියන්න. ඔබේ ආත්මික වර්ධනයට අපි මඟ පෙන්වන්නෙමු.

**- ගුරුහරු -**




# ප්‍රතිනිර්මාණය

බදුල්ල ප්‍රදේශයේ සාමාන්‍යය පවුලක දෙවන දරුවා ලෙස මා උපත ලැබීය. මගේ පියා වෘත්තියෙන් වඩු කාර්මිකයෙක් වූ අතර මව තේ දළු නෙලීමෙහි නිරත විය. අයියා සහ නංගී සමඟ මා පාසල් අධ්‍යාපනයෙහි යෙදී සිටියෙමි. අපේ ළමා කාලය සුන්දර වූත් අඟහිඟකම් වලින් පිරුණාවූත් එකකි. මගේ පියා සහ මව කිතුණුවන් වූ නිසා අපි ඉරුදින පාසලට සහ සභාවට සහභාගී වුණෙමු.

කුඩා කළ සිටම සහෝදරයාට සහ සහෝදරියට වඩා මම බොහෝ වෙනස් කෙනෙකු විය. සෑම විටම ස්වාධීන පුද්ගලයකු වූ මා සමාජ ඇසුරට ප්‍රිය කළෙමි. ගෙදරින් පිටත ජීවත් වීමට මා ප්‍රිය කළ නිසා ඉතා කුඩා අවධියේ සිටම මා ගෙදරින් පිටත ජීවත් වුනෙමි. දෙමව්පියන්ද මගේ අකීකරුකම් ගැන කණස්සලු වූහ. කුඩාකල සිටම ඉතා හොඳ කථිකත්වයක් තිබූ මා මගේ නිවස ආසන්නයේ අය පමණක් නොව, මුලු ප්‍රදේශයම වාගේ මා හඳුනති. " කරන්න බැරි දෙයක් නැහැ" යන්න තරුණ මාගේ ජීවිතයේ ආදර්ශ පාඨය විය. දෙමාපියන්ගේ දුක් විදීම දැන සිටි මා ඔවුන්ට උපකාර කිරීමට සෑම විටම අවශ්‍ය විය. පාසැල නිම වී නිවසට එන මා නැවතත් ඉක්මනටම කුලී වැඩක් හෝ අත්වැඩ දීමට ගියෙමි. සමාජය තුළ මිනිසුන්ගෙන් යම් විශ්වාසයක් දිනා ගැනීමට මට පුලුවන් වී තිබුණි. නමුත් මාගේ ජීවිතයේ බොහෝ රහසි ගත අඳුරු තැන් තිබුණි.

කුඩා කළ සිටම මට දෙවියන්වහන්සේව හඳුන්වා දී තිබුණත්, මා උන්වහන්සේව හඳුනාගෙන තිබුනේ නැත. බලෙන් මෙන් අම්මා කියා දුන් බයිබල් පද සහ බයිබල් කතන්දර මා මතකයෙන් දැන සිටියත් හදවතින් පිළිනොගත්තෙමි මගේම බලය, මගේම ශක්තිය, මගේම හැකියාව, මගේම සිතුවිලි හා මගේ කැමැත්ත හැම විටම මගේ ජීවිතයේ ක්‍රියාත්මක විය. මේ කාලයෙහි මම සාමාන්‍ය පෙළ විභාගය සමත් වූවත් ඒ උනන්දුවකින් හෝ උත්සාහයකින් පාඩම් වැඩ වල නිරත වී නොවේ. මම වඩාත් යොමු වූයේ මගේ ජීවිතය, මගේ සතුට, මගේ කැමැත්ත කිරීමට නිසා පවුලේ අය සමගද මා කිට්ටු සම්බන්ධයක් පවත්වාගෙන ගියේ නැත. මගේ ජීවිතයේ අඳුරු, රහස්, පාප සහිත ජීවිතය කෙමෙන් කෙමෙන් එළිදරව් වන්නට පටන්ගත් නිසා මම විදේශගත වීමට තීරණය කළෙමි. ඒ එම පාප සහිත අඳුරු පැතිකඩ නිසා මට පවුලේ අයටද මුහුණ දීමට නොහැකි වන බව දන්නා නිසයි. මව සහ පියාට හොරෙන් විදේශ ගමන් බලපත්‍රයක් ලබාගෙන කිසිවෙකුට නොදන්වා විදේශගත වීමට මම කටයුතු සම්පාදනය කරගෙන සිටියෙමි.

මේ අතර තුර සභාවේ පැවැත්වූ විශේෂ රැස්වීමකට මට සහභාගී වීමට සිදුවූ අතර එහි පැමිණ සිටි දේවසේවකයෙකු කොළඹ සභාවෙහි දින කිහිපයක් ගත කිරීමට මට ආරාධනා කළේය. ආරාධනාව පිළිගත් මා ඉතා ඉක්මණින් එම ආරාධනාවට ප්‍රතිචාර දැක්වූයෙමි. සුපුරුදු පරිසරයෙන් මිදුනු මට දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් මගේ ජීවිතයේ දැනෙන්නට පටන් ගත්තෙමි. නිතර නිතර දේශනා, බයිබල් අධ්‍යනයන්, සඳහා සහභාගී වී ඒවාට සවන් දීමට හැකි විය. මගේ ජීවිතය සහ මගේ සිතුවිලි දෙවියන්වහන්සේට භාර දෙන්නට මම තීරණය කළෙමි. දණ නමා, මගේ සියලු පාප, සියලු රහස්, සියලු අඳුරු පැතිකඩයක්ම උන්වහන්සේට කියා යේසුස්වහන්සේගේ ශ්‍රී රුධිරයෙන් මගේ පාප සෝදා ගත්තෙමි. බයිබලයක් ලබාගෙන දිනපතාම එය කියවා අධ්‍යනය කරන්නට මම පෙළඹුණෙමි. උන්වහන්සේ මට සිතේ සමාදානයද, ප්‍රීතියද, සත්‍යවාදීකමද, ලබාදුන් සේක. මේවා ක්ෂණිකවම සිදු වූයේ නැත. දවසින් දවස, අත්දැකීමෙන් අත්දැකීමට උන්වහන්සේ මා වෙනස් කල සේක.



දැන් මම නොව උන්වහන්සේය, මගේ කැමැත්ත නොව උන්වහන්සේගේ කැමැත්තය, මගේ තීරණය නොව උන්වහන්සේගේ මඟපෙන්වීමය, බොහෝ සේවයේ අවස්ථාවන් උන්වහන්සේ මට ලබා දී තිබෙන සේක. ජීවිතයේ අඳුර වෙනුවට දැන් ඇත්තේ ආලෝකයය. සදාකාල විනාශයට යමින් සිටි මා උන්වහන්සේ උන්වහන්සේගේ මාර්ග වල ශක්තිමත් කර ගෙන යන සේක. තරුණයෙකු ලෙස පාපයේ ඇති සතුට අත්හැර කුරුසිය ගෙන උන්වහන්සේ පසුපස යෑමට තීරණය කිරීම ලෙහෙසි නොවීය. නමුත් උන්වහන්සේ ඉදිරියෙහි හදවත වැගිරවීමෙන් උන්වහන්සේ මා ප්‍රති නිර්මාණය කිරීම ආරම්භ කල සේක. මා දැන් උන්වහන්සේ උදෙසා ජීවත් වෙමි. තරුණ ඔබත් මේ තීරණය ගන්න. එනම් යේසුස්වහන්සේට තම ජීවිතය බාර කර උන්වහන්සේ උදෙසා ජීවත් වීමට.

**"තරුණයෙක් තමාගේ මාර්ගය පවිත්‍ර කරගන්නේ කුමකින්ද? ඔබගේ වචන ප්‍රකාර පැවැත්මෙනි. මාගේ මුලු සිතින් ඔබ සෙවීමි, ඔබගේ ආඥාවලින් මුළාව යන්නට මට ඉඩ නොදුන මැනව, ඔබට විරුද්ධව පව් නොකරන පිණිස ඔබගේ වචනය මාගේ සිතේ නිධාන කර ගතිමි" (ගීතාවලිය 119:9-11).**

**ජෝන් නෙවිල් - බදුල්ල.**




# ඉන්දියාවේ අපෝස්තුළුවරයා

## සාදු සුන්දර් සිං (1889 - 1929)



### ළමා අවදිය

සුන්දර් සිං, සාමාන්‍ය ව්‍යවහාරය ලෙස සාදු සුන්දර් සිං **1889 සැප්තැම්බර් 3 වන දින පන්ජාබ්හි රම්පුර් හී උපත ලැබීය.** ඔහුගේ දෙමාපියන් ශික් ආගමිකයන් වූ අතර මව ආගමට ලැදි භක්තිවන්තියක් වූවාය. පළමුව භාවනාවට කාලය යොදවා, ආත්මික ආශිර්වාද ලබාගත් පසුව උදේ කෑම අනුභව කළ යුතු බව සුන්දර්ගේ මව තරයේ ඉල්ලා සිටියාය. ඈ ඔහුට බොහෝ සේ ආදරය කළ නිසා, ඇගේ ආශාව වූයේ ඔහු ආගමට ලැදිව, ශුද්ධ සාදු කෙනෙකු කරවීමය. හින්දු ආගමේ පොත වූ භගවත්ගීතාව ඉතා කුඩා අවදියෙහි පටන්ම කියවන්නට වූ නිසා වයස හත වන විට කටපාඩමින් එය කියවන්නට ඔහුට හැකියාව තිබිණි. ඔහුගේ හිතවත් මිතුරාගේ මරණයෙන් පසුව නොයෙකුත් ආගමික පොත් අධ්‍යනය කරන්නට පටන් ගත් ඔහු, අනෙකුත් මනුෂ්‍යයන් සුව නින්දේ පසුවන විට ශික් ආගමේ 'ග්‍රන්ථයද' හින්දු භක්තිකයින්ගේ 'වේදුස්' හෝ මුස්ලිම් අයගේ 'කෝරානය' කියවන්නට යෙදුනි. රටෙහි සිටි දහස් ගණන් ජනතාවගේ ආත්මික පිපාසය ඔහු ගත්තේය.

### ජීවමාන ක්‍රිස්තුස්වහන්සේ මුණ ගැසීම

පළමුව ක්‍රිස්තියානි ආගම ගැන දැන ගැන්මට සුන්දර්ට හැකි වූයේ ගම්බද මිෂනාරි පාසලක ඉගෙන ගැනීමට ගිය අවස්ථාවේදීය. ඔහුට බයිබලය පාඩම් කරන්ට කී විට, ඔහුගේ හදවත තුළ පොර බැදීමක් ඇති විය. ඔහු ප්‍රසිද්ධියේ අළුත් ගිවිසුමේ කොළ ඉරා දමා, ක්‍රිස්තු ධර්මයට විරුද්ධව ක්‍රියා කරන ශිෂ්‍යයින්ගේ නායකයා විය. එම පාසලෙන් අස් වී ඔහු ආණ්ඩුවේ පාසලකට ගොස් ක්‍රිස්තු ධර්මයට නිග්‍රහ කළේය. ඔහු සමහර අවස්ථාවන්හි දී ප්‍රසිද්ධ ස්ථානවල රැස්වීම් පවත්වන මිෂනාරීවරුන්ට ගල් ගැසීමට සහ මඩ ගැසීමට මනුෂ්‍යයින් පොළඹවන්නට විය. ඔහු ප්‍රසිද්ධියේ අළුත් ගිවිසුම පිළිස්සීය. ඔහු ක්‍රිස්තුස්වහන්සේ එපා කරන්ට කරන්ට, ඔහුගේ හදවත කනස්සල්ලෙන් පිරී ගියෙන්, අන්තිමේදී ඔහු බයිබලය කියවන්නට පටන් ගත්තේය.

දිනක් පාන්දර තුනට පිබිද ඔහු තම ජීවිතයට සාමය ලැබුණෝ නැතිනම් තම නිවස ඉදිරියෙන් යන දුම්රියට පැනීමෙන් ජීවිතය නැතිකර ගැනීමට අධිෂ්ඨාන කර ගත්තේය. ඔහු නා පිරිසිදු වී මෙසේ යැදීය.

"අනේ දෙවියනි, දෙවිකෙනෙක් සිටිනවා නම් මට අනාවරණ වන්න, මට විමුක්තියේ මාර්ගය පෙන්වා ශාන්තිය දෙන්න." මෙසේ ඔහු යදින්ට පටන් ගත් විට හදිසියේ මහත් ආලෝකයක් ඔහු සිටි කාමරයේ දිස් විය. එම ආලෝකය මධ්‍යයෙහි ඔහු ප්‍රතික්ෂේප කළ ජීවමාන ක්‍රිස්තුස්වහන්සේ ඔහු දිටීය. උන්වහන්සේගේ සිදුරු වූ අත්, සුන්දර්ට පෙන්වමින්, 'ඔබ මට පීඩාකරන්නේ මන්ද? මා ඔබගේ ගැලවුම්කරු'යි කීහ. එම මොහොතේදී සුන්දර්ගේ හදවත ප්‍රීතියෙන් පිනා ගියේය. ඔහුගේ ආත්මික පිපාසය සංසිඳිනි. ඔහු අත්දුටු මෙම පුදුම අත්දැකීම, එහුට අවිශ්වාස කිරීමට නුපුළුවන් විය. ඔහුගේ ජීවිතය සම්පූර්ණයෙන් වෙනස් විය.

## දුක් විඳීමට කැඳවන ලදී

මෙම අත්දැකීම ඇතිවූවාත් සමගම, සුන්දර් තමා කිතුණුවෙකු බව තම පියාට දැන්විය. පළමුව පියා මෙය විශ්වාස නොකළත්, ඔහු කිතුණුවෙකු වීමට තීරණය කර ඇති බව දුටු සුන්දර්ගේ පවුලේ සියළු දෙනා විශ්මයට පත්වූහ. තම මවගේ ආගම අත්හැර, ඔවුන් ලැජ්ජාවට පත් නොකරන ලෙස ඔවුහු ඔහුගෙන් ඉල්ලා සිටියහ. ඔහුගේ පොහොසත් මාමා කෙනෙකු, ඔහුගේ නිවසට සුන්දර් කැඳවා ගෙන ගොස්, ඔහු අළුතෙන් ඇතිකර ගත් ඇදහිල්ල එපා කළොත් තමා සන්තකව තිබූ මුදල් සම්භාරයද, අගනා මුතු මැණික් සියල්ලද; ඔහුට දෙන බව පැවසීය. එනමුත්, ක්‍රිස්තුස්වහන්සේට තම සිත්හී තිබූ දැඩි ප්‍රේමය නිසා ඒ ඇදහිල්ල එපා කිරීමට ඔහුට නුපුළුවන් විය. ඔහු ගෙදරින් පන්නා දමන ලදුව, ආහාර නොමැතිව, ගසක් යට ශීතලේ රාත්‍රිය ගත කළ පසු, නැවත ඔහුට ගෙදර ඒමට අවසර ලැබුණි. එසේ වුවත්, කෑම දෙන ලද්දේ නිවසින් බැහැරවය. නිදා ගැනීමට දෙන ලද්දේද පහත් කුලේ වැඩ කරුවන් සමඟය. ඔහු තම ස්වාමින්වහන්සේගේ නාමය නිසා ඒ සියල්ල සතුටින් විඳ දරා ගත්තේය. මෙය ඔහු ඉදිරියෙහි නොනැවතී ස්වාමින්වහන්සේ උදෙසා විඳින්නට යන දුක්වල පටන් ගැන්මයි. අවසානයේ ඔහුට වඩ දී නිවසින් පන්නා දමන ලදී. ඔහු මරණාසන්න විය. එහෙත් දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ මහත් අරමුණ ඉෂ්ඨ කිරීම සඳහා මරණින් ඔහු ගලවාගත් සේක.

සුවය ලැබ, ලුඩියානාවට ගොස්, මිෂනාරිවරුන් සමග නැවතී, දේව වචනය හැදෑරූ ඔහු තම දහසයවන උපන් දිනයේදී, සිම්ලා නගරයේදී බව්තිස්ම ලැබුවේය. ඉන් අනතුරුව, ඔහු දේව මඟපෙන්වීම සොයමින් බොහෝ සේ යාච්ඤා කොට, තම ජීවිතය සම්පූර්ණයෙන් ක්‍රිස්තුස්වහන්සේට කැප කොට කිතුණු 'මිෂනාරිවරයකු' කෙනෙකු බවට පත්විය. තමා සන්තකව තිබූ සියල්ල හා පොත් අන්‍යයන්ට දී කබායක් ඇඳ, පයට වහන් නොමැතිව, අතෙහි අළුත් ගිවිසුමක් ඇතිව, කිසිම මනුෂ්‍යයකුගේ සරණක් නෙමැතිව, තම ස්වාමින්වහන්සේට සේවය කිරීම පිණිස ඔහු ගියේය. ඔහුගේ ආදර්ශ පාඨය වූයේ, **"අපගේ ස්වාමී වූ යේසුස්**

**ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ගැන මිස වෙන කිසි දෙයක් ගැන පාරට්ටුකරගන්නට මට නම් සිද්ධ නොවේවා; ඒ කරණකොට ගෙන ලෝකය මටද, මා ලෝකයටද, කුරුසියෙහි ඇණ ගසනු ලද්දේ විය." යන්නයි (ගලාති 6:14)** ඔහු සැමවිට කී වදනක් නම්, **"ක්‍රිස්තුස්වහන්සේ, මා උදෙසා ප්‍රේමයෙන් ජීවිතය පූජා කල සේ මා ද, ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවිතය පූජා කල යුතුය."** යන්නයි.

## සාදු කෙනෙකු සේ

තරුණ වියේදී ඔහුට තම ස්වාමින්වහන්සේ උදෙසා, කුසගින්න, ශීතලය හා ලෙඩ දුක් විඳින්ට සිදු විය.සමහර විට හිර ගෙවල සිටියේය. තම ස්වාමින්වහන්සේගේ ප්‍රේමය ගැන අසා නැති අයට ප්‍රකාශ කිරීමට, අවුරුද්දක් පාසා අවුරුද්දක් පන්ජාබ්, කාශ්මීරය, ඇෆ්ගනිස්ථානය, නේපාලය හා ටිබෙට් කඳුහෙල් අතර ඔහු ගමන් ගත්තේය. බොහෝ අවස්ථාවන්හීදී විරුද්ධවාදීකම් වලට හා එපා කිරීම් වලටද ඔහු මුහුණ පෑවේය. බොහෝ විට පලවා හරින ලදුව රාත්‍රියේ වනාන්තරයේ බඩගින්නේ ගත කිරීමට ඔහුට සිදුවිය. ශීත සුළඟින් රැකවරණය ලබා ගැනීමට ගුහා වල ලැගුම් ගන්නා විට වන සත්තු ද ඔහු සමඟ ගුහාවේ සිටියහ. එක් උදෑසනක ඔහුට නුදුරුව දිවියෙක් නිදා සිටිනු ඔහු දිටීය. තවත් දිනක් කොටියෙකු තම ගුහාවේ සිටි බව දැක්කේය. හිමිදිරි උදෑසනක ඔහුගේ පොරෝනය තුළ රැකවරණයත් උණුසුමත් ලබමින් සිටි විශාල නාගයෙකු ඔහු දුටුවේය. ඔහු හිමාලයේ කඳුවැටි වල ගමන් ගන්නා විටද වහන් නොදමා ගිය බැවින්, ඔහුගේ පා ගල් වලට සහ හිමට කැපී බොහෝ අවස්ථාවන්හීදී දෙපා වලින් ලේ ගැලුවේය. මේ නිසා" පාද වලින් ලේ ගලන අපෝස්තුළුවරයා" යන්නෙන් ඔහු අමතන ලදී.

වධ හිංසා මධ්‍යයෙහි ඔහු තුළ තිබුණු ඉවසීම සහ ප්‍රීතිය නිසා මනුෂ්‍යයින්ට ඔහුගේ පණිවුඩය පිළිගැනීමට සිදුවිණි. ඔහු එක්තරා ගමකට ගොස් දර කොටයක් මත හිඳ, ගීතිකා කරන්නට පටන් ගත් විට, සමූහයක් එකතු විය, එනමුත් ඔහු යේසුස්වහන්සේ ගැන කථා කරන්ට පටන් ගත් විට, සමූහයා කුපිත වූහ. නොසිතූ අවස්ථාවක රූපේ රාම් නම් පුද්ගලයකු සුන්දර්ට ගැසූ තද පහරක් නිසා ඔහු ඇද වැටුනේය. ඔහුගේ කම්මුල් සහ අත් ගල් වලට කැපී ලේ ගලන්නට පටන් ගත්තේය. ඔහු හෙමින් නැගිට ඔහුගේ එදිරිකාරයන් උදෙසා යාච්ඤා කොට, ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය ගැන කීවේය. රූපේ රාම් මේ ගැන අසා මවිතව පසුව ඇදහිලිවන්තයෙක් විය.
දිනක් සුන්දර් සිං සොරුන් ගැවසෙන ප්‍රසිද්ධ වනාන්තරයක් මැදින් යන විට, මිනිසුන් සතර දෙනෙක් ඔහු වට කොට, එක් පුද්ගලයෙක් ඔහුට පිහියක් දිගු කළේය. ඔහුගේ අවසානය පැමිණ තිබේය සිතා යාච්ඤා කරන විට, ඒ මනුෂ්‍යයා මවිතව ඔහු කවුදැයි විචාලේය. තමා කිතුණු කෙනෙකැයි පැවසූ සුන්දර්, ඔහුට අළුත් ගිවිසුම පෙරළා ධනවතා සහ ලාසරස්ගේ කතාව කියෙව්වේය. ඒ මිනිසාට තමාගේ පාපය හැඟුණේය. ඔහු සුන්දර්ව ගුහාවකට ගෙන ගොස්

එහි තිබූ මිනිස් ඇටසැකිලිවලට අත දිගු කරමින්, ඒ සියලු මරණවලට වග කිව යුත්තා තමා යැයි කීවේය. සුන්දර්, ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති පාප සමාව පිළිගැනීමට ඒ මිනිසා පෙළඹවිය.

## ටිබැට්හී දී

සුන්දර් ක්‍රිස්තුස්වහන්සේ ගැන එතෙක් අසා නොතිබූ දුෂ්කර වූත් භයානක වූත් පලාත් වලට ඕනෑකමින්ම ගියේය. ටිබැට් රට මිථ්‍යාවන්ට හා යකුන්ට බයව සිටී හෙයින් ඔහුට එම රට කෙරෙහි විශේෂ ආශාවක් තිබිණ. ආගම් නායකයින් හා ලාමාවරුන් දුප්පත් ජනතාවට පීඩා කළහ. එහි සිටී අය සිතුවේ යාච්ඥා කිරීමට හැකි මාර්ගය නම්, යාච්ඥා ලියා ඇති කව, කරකැවීමෙන් හෝ යාච්ඥා ලියා ඇති ධජ සුළඟේ සෙලවෙන්නට හැරීමෙන් කියාය. මේ මනුෂ්‍යයින් කිසි දිනක ක්‍රිස්තුස්වහන්සේ ගැන අසා තිබුණේ නැත. වරින් වර ඔහු ටිබැට් රටට ගියේය. එක් අවස්ථාවකදී, අඩි 16,000 උස ස්ථානයක අධික ශීතලේ ගැහි ගැහි කඳු බෑවුමක එළිමහනේ නිදාගන්නට ඔහුට සිදුවිය.

වරක් ඔහු නගරයක, විදේශීය ආගමක් දේශනා කරනවාය කියා, අල්ලා ගනු ලැබ වරදකරු බවට පත් කොට ඔහුගේ ඇඳුම් ඉරා, ඉතා ගැඹුරු හිස් වළකට දමා එහි උඩ වසා අගුල් දමනු ලැබීය. තව බොහෝ දෙනෙකුටද මීට ඉහත මෙම ඉරණමම අත්ව තිබුණි. ඔවුන්ගේ ඇටකටු හා දියවී යන මළකුණු උඩට සුන්දර් වැටුණේය. එය ඉතා දුගඳ විය. වැටෙන විට ඔහුගේ අත තුවාල වී එය මහත් වේදනා ගෙන දුනි. ඔහු දින තුනක්, කුසට ආහාරයක් නොමැතිව, වතුර පොදක් නොමැතිව, නින්දක් නැතිව, අන්ධකාර වළේ දුක් විඳිමින් සිටියේය. තුන්වන දින රාත්‍රියේ දෙවියන්වහන්සේට ඔහු යාච්ඥා කරන විට ඔහුට ශබ්දයක් ඇසිණි. එවිට උඩ තිබුණ දොර විවෘත වී කඹයක් එල්ලෙමින් තිබෙනු ඔහු දිටීය. ඔහුට එම කඹයේ එල්ලී එන්න යැයි කියන හඬක් ඇසිණි. ටික වේලාවකින් ඔහු එම වලෙන් ගොඩට ආවාට පසු ඔහු මුදා ගත් තැනැත්තා වළේ කට වසා නොපෙනී ගියේය. එවිට දෙවියන්වහන්සේ ඔහු මුදාගත් බව සුන්දර් දැන ගත්තේය. නැවත ඔහු ශක්තිමත් වූ පසු දේශනා කරන්නට පටන් ගත්තේය. ඒ දේශනා අසා බොහෝ ටිබෙට් ජාතික අය ගැලවීම ලැබූහ.

## නේපාලයේ

සුන්දර්ගේ කාලයේ ශුභාරංචිය අසා නොතිබුණු තවත් දේශයකි. ඉන්දියාවේ උතුරේ පිහිටී නේපාලය. එම රටේ ශුභාරංචිය දේශනා කිරීම තහනම් කර තිබිණි. සුන්දර් නේපාලයට ගොස් ක්‍රිස්තුස්වහන්සේ ගැන දේශනා කළේය. ඔහු අල්ලා සිර ගෙදර දමන ලදී. සිර මැදිරියේ සිටින විට සිරකරුවන්ට ක්‍රිස්තුස්වහන්සේ ගැන කියා දුන් බැවින්, තනි සිර මැදිරියකට ඔහු දමන ලදී. ඉතා දුගඳ වූ හරක් මඩුවක් තුළ ඔහුගේ ඇඳුම් ගලවනු ලැබ අත් පා බඳිනු ලැබීය. සමහරු කූඩැල්ලන් ඔහුගේ ඇඟට විසි කළ විට උන් ඔහුගේ ලේ

උරා බීවෝය. මෙවැනි පීඩා මධ්‍යයෙහි ද සුන්දර් දෙවියන්වහන්සේට යාච්ඤා කරමින් ප්‍රශංසා ගී ගැයීය. එහි සිටි නිළධාරීන් ඔහුට පිස්සු යැයි සිතා නිදහස් කළේය. කූඩැල්ලන් ලේ උරා බීමෙන් ඔහු දුර්වල වී සිටියද සුන්දර් නගරයට ගොස් නැවත දේශනා කරන්ට පටන් ගත්තේය. සුන්දර් සෑම දුක් පීඩා විඳීමකදීම කීවේ," මාගේ ගැලවුම්කරු නිසා දුක් විඳීම මහත් ප්‍රීතියක්" කියාය. මෙම ප්‍රීතියේ රහස කුමක්ද? ඔහු කියා සිටියේ,"ආත්ම දිනා ගැනීමේදී වැය වීම සහ දුක් පීඩා සඳහා මගේ සැනසීමත්, බලාපොරොත්තුවත්, දිරි ගැනීමත් වූයේ ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය"ය යන්නයි. "ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ග සම්පත් අත්හැර, කුරුසියේ බර උන්වහන්සේ පිටට ගැනීම නිසා මා කුරුසිය ගෙන ඇත්තේ උන්වහන්සේ උදෙසා ආත්ම දිනා ගැනීමටය" යන්නයි. නේපාලයේ සිරගතවී සිටීමේ අත්දැකීම් ගැන කථා කරන විට ඔහු කීවේ, "මා සිටි සිර මැදුර ආශිර්වාද ලත් ස්වර්ග යක් වූයේ එහි ක්‍රිස්තුස්වහන්සේ සිටී නිසා" කියාය.

## ලෝකයට අභියෝගයක්

ඒ වන විට ඔහුගේ දුක් විඳීම් සහ අද්විතීය අත්දැකීම් සැමතැනම පතල විය. ඉන්දියාවේ සිටි මේ අපෝස්තුළුවරයා ගැන ලොව පුරා සිටි කිතුණුවන්ගේ අවධානය යොමුවිනි. ඉන්දියාවේ සිටි කිතුණුවන්ට හා කිතුණුවන් නොවූවන්ට කථා කිරීමට ඔහුට ආරාධනා ලැබුණි. ඔහු ගිය සෑම ස්ථානයකදීම කිතුණුවන්ට දුන් අභියෝගය නම් තමකම නසා කුරුසිය රැගෙන තම ස්වාමියා අනුග මනය කරන්න කියාය. ඔහු දුන් මිෂනාරී අභියෝගය බොහෝ දෙනෙකු උනන්දු කිරීමට හේතු විය. ඔහු ලංකාව, බුරුමය, මැලේසියාව, චීනය හා ජපානයෙහි සංචාරය කළේය. ඔහු බටහිර රටවල් වූ එංගලන්තය, ඇමරිකාව, ඕස්ට්‍රේලියාව හා බොහෝ යුරෝපා රටවලද සංචාරය කළේය.

## අවසාන වචන

1929 අප්‍රියෙල් 18 වන දින, සුන්දර් සිං, ඔහුගේ මිත්‍රයෙකුට මෙසේ ලීවේය. **"මා අද ටිබෙට් නගරයට යනවා, එහිදී මට මුහුණ පාන්නට වන බාධක හා අනතුරු ගැන මා දන්නවා, එනමුත් මා, මගේ සේවය සඳහා උපරිම කොටස කරන්නට ඕනෑය."** ඔහු පැමිණෙන්නට තිබූ දිනය පසු විය. ඔහු නැවත පැමිණියේ නැත. ඔහු ගැනවත්, ඔහුගෙන් වත් ආරංචියක් ලැබුණේ නැත. ඔහු කන්දකින් වැටී ඒවා අතරෙහි නැති වී යන්නට ඇත, නැතහොත්, ටිබැට් හී වේද සාක්ෂිකයෙකු ලෙස මැරුම් කන්නට ඇත, නැත්නම් තෙත, යක්හමක දමා මසා, ඒ හැකිලෙන හම ඔහුගේ ඇට පොඩි කරන තුරු අව්වේ වේලෙන්නට හරින්නට ඇත. ඔහුගේ අවසානය කුමක් වූවත්, ඉන්දියාවේ අපෝස්තුළු සාදු සුන්දර් සිං ගැන අපට ඇති සහතිකය නම් ඔහුට නියමිතව තිබූ ඔටුන්න වන ජීවනයේ ඔටුන්න යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔහුට පළඳවන්නට ඇති බවය.

**- ජීවනයේ හඬ -**

# ශුද්ධාත්මයාණන්වහන්සේ රැවටීම

කිතුණු සභාව ආරම්භයේදී එක්තරා කණගාටුදායක ලෙස දෙවියන්වහන්සේගේ විනිශ්චයට භාජනය වුනා වූ යුවලක් පිළිබඳව අපි ක්‍රියා 5 වැනි පරිච්ඡේදයේ කියවන්නෙමු. එය ක්‍රියා 5 වැනි පරිච්ඡේදයේ 1 වැනි පදයේ සිට 11 වැනි පදය දක්වා ඔබත් කියවා බලන්න.

මොවුන් දෙදෙනා ස්වාමි පුරුෂයා හා භාර්යාවය. ඔවුන් නමින් අනනියස් සහ සප්පිරා ය. ඔවුන් ජෙරුසලමේ සභාවේ ක්‍රියාකාරී සාමාජිකයන් බවයි පෙනී යන්නේ. ඔවුන් සමහර විට සභා නායකයින් සමඟ ඉතා ලඟින් ඇසුරු කරමින් විවිධ සේවයන් වල යෙදී සිටින්නට ඇත. සභා ඇදහිලිවන්තයින් අතර යහපත් යැයි ප්‍රසිද්ධව සහ ජනප්‍රියව සිටියා විය හැකිය. එහෙත් ඔවුන් ගැළවීම ලබා ස්වාමින්වහන්සේ සමඟ නිවැරදි වූ සම්බන්ධතාවක් පවත්වා ගෙන ගියේ දැයි සැක සහිතය. එය ස්වාමින්වහන්සේ දන්නා සේක. නමුත් මොවුන් දෙදෙනා දෙවියන්වහන්සේගේ ඉතාමත් භයානක විනිශ්චයට ලක් විය. ඒ කෙසේද යත් මොවුන් සතු ඉඩමක් විකුණා එම මුදල් වලින් කොටසක් සභා නායකයන් වෙත ගෙනත් දුන්හ. ඉතිරි කොටස ඔවුන් සන්තකයේ තබා ගත් අතර එය මුළු මුදලෙන් කුමන ප්‍රතිශතයක් දැයි අපි නොදනිමු. එමෙන්ම සභාවට දුන් කොටසද මුළු මුදලෙන් කුමන ප්‍රතිශතයක් දැයි අපි නොදනිමු. එහෙත් ස්වාමින්වහන්සේ එය දන්නා සේක. ඔවුන් කළේ යහපත් දෙයකි. ඔවුන් සතු මුදලක් දෙවියන්වහන්සේගේ සේවයට පරිත්‍යාග කිරීම. එය යහපත් දෙයක් නම් ඔවුන් දෙවියන්වහන්සේගේ උදහසට ලක් වූයේ ඇයි? එසේ නම් ඔවුන් කළ වරද කුමක්ද? ඔවුන් කළ වරද නම් බොරු කීමයි. ඔවුන් සභා නායකයන්ට පැවසුයේ එම මුදල ඉඩම විකිණූ මුළු මුදල බවයි.

**ක්‍රියා 5 : 2** ට අනුව මෙය ස්වාමි පුරුෂයා හා භාර්යාව එකතුව සැලසුම් කල බොරුවකි. එය සතර කන් මන්ත්‍රණයකි. නමුත් එය ස්වාමින්වහන්සේ අසාගෙන සිටි සේක. ශුද්ධාත්මයාණෝ එය සභා නායකයන්ට එළිදරව් කළ සේක. ඔවුන්ට මුළු මුදල ඔවුන් සතුව තබා ගැනීමට හැකියාව තිබිණි. එනම් කිසිවක් සභාවට නොදීමට අවසර තිබුණි. කොටසක් දීමට ද අවසර තිබුණි. ඕනෑම ප්‍රමාණයක් දීමටද අවසර තිබුණි. ඇයි ඔවුන් බොරු කීවේ? තමාගේ ත්‍යාග ශීලි බව, කැපවීම සභාව ඉදිරියේ මවා පෑමටය. එමෙන්ම තමන් හොඳ කිතුණුවන් බව පෙන්වීමට ඔවුන්ට අවශ්‍ය විය. එමෙන්ම සභා නායකයින්ගෙන් හා අනිත් අයගෙ න් ප්‍රශංසාව ලබා ගැනීමට ඔවුන් දැරූ උත්සාහයක්ද විය හැකිය. එමඟින් ඔවුන් දැඩි පරීක්ෂාවකට ලක් විය. එම නිසා මනුෂ්‍යයින් පමණක් නොව දෙවියන්වහන්සේ ද ඔවුන් රැවටීය. අපත් මෙවැනි පරීක්ෂාවන් වලට කී වතාවක් හසු වී ඇත්ද? අපි අන් අයට වඩා හොඳ අය යැයි හෝ අන් අයට වඩා වටිනා අය යැයි පෙන්වීමට කී වරක් උත්සහ කර තිබේද? මනුෂ්‍යයන් ඉදිරියේ අප නොකලා වූ යහපත් දේ ගැන මනුෂ්‍යයින්ගේ ගෞරවය හා ප්‍රශංසාව ලබා ගැනීමට උත්සහ කර තිබේද? අප කලා වූ වැරදි ක්‍රියාවන් වලින් නිදහස් වීමට උත්සහ කර ඇත්ද? ඉහත ප්‍රශ්න වලට උත්තරය ඔව් නම් අපද අනනියස් හා සප්පිරාට වඩා හොඳ

නැත. එනම් අපද ශුද්ධාත්මයාණන්වහන්සේ රවටන්නට උත්සහ කර ඇත. අනනියස්ගේ හා සප්පිරාගේ වරද අනාවරණය වී තිබුණි. ඔවුන් ශුද්ධාත්මයාණන්වහන්සේට බොරු කියා තිබේ. පේත්‍රුස්ගේ ප්‍රශ්නය වුණේ මෙවැනි දෙයක් කරන්නට නුඹලා පෙළඹුනේ කොහොමද කියාය. එය අද අප වෙත එල්ලවන හොඳ ප්‍රශ්නයකි. බොරු කීමට අප පෙළඹෙන්නේ ඇයි?

මුදල් නිසා, නිලතල නිසා, තම ගෞරවය නිසා හෝ අපගේ ආත්මාර්ථකාමී අරමුණු උදෙසා බොරු කීමට පෙළඹුණු අවස්ථා අපගේ ජීවිතයේ කොපමණ තිබෙනවාද? මතක තබා ගන්න, ඒ හැම අවස්ථාවකම අපත් ශුද්ධාත්මයාණන්වහන්සේ රවටන්නට උත්සහ කර ඇත. බොරුවේ පියා යක්ෂයාය. බොරු කීම පාපයක් බව බයිබලය අපට නැවත නැවත පෙන්වා දෙයි. අප බොරුවක් වංචාවක් කරන සෑම අවස්ථාවකදීම ශුද්ධාත්මයාණන්වහන්සේ දුකට පත් වන අතර සාතාන් ප්‍රීති ඝෝෂා පවත්වයි.

අනනියස් වෙතට දෙවියන්වහන්සේගේ විනිශ්චය පැමිණ ඔහු මරණයට පත් විය. මනුෂ්‍යයෝ ඔහුගේ මෘතදේහය රැගෙන ගොස් වලලා දැමුවෝය. ඉන් පැය 3කට පමණ පසුව ඔහුගේ භාර්යාව වන සප්පිරා ඔහු සොයාගෙන පැමිණියාය. එය දුටු පේත්‍රුස් ඇය ළඟට පැමිණ ඉඩම විකුණුයේ මෙම ගණනටද යැයි ඇගෙන් නැවත විමසුවේය. **(ක්‍රියා 5:8)** ඇයත් එම බොරුවම පැවසුවාය. පේත්‍රුස් නැවතත් ඇගෙන් මෙසේ විමසීය. දෙවියන්වහන්සේ රැවටීමට නුඹ එකඟ වුණේ කොහොමද? පේන විදිහට ඇයත් මරණයට පත් වන බව ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පේත්‍රුස්ට එළිදරව් කර තිබුණි. ඇය බොරුව කියූ සැනින් පේත්‍රුස්ගේ පා මුල මැරී වැටුණාය. මට හිතෙන විදිහට නම් ඇය මේ අවස්ථාවේ සත්‍ය ප්‍රකාශ කළේ නම් දෙවියන්වහන්සේගේ විනිශ්චයෙන් ගැලවීමට ඇයට අවස්ථාව තිබුණි. නමුත් දෙවියන්වහන්සේ සියල්ල දන්නා සේක. මොවුන් සැබෑ ඇදහිලිවන්තයෝද කියා අපි නොදනිමු. මොවුන්ගේ ආත්ම ගැළවුනේ දැයි අපි නොදනිමු. එය දන්නේ දෙවියන්වහන්සේ පමණි. නමුත් මෙයින් අප එක් දෙයක් උගනිමු. සැලසුම් සහගතව බොරු කීම හෝ දෙවියන්වහන්සේට විරුද්ධව පව් කිරීම ඉතා භයානක බවය. **"මක්නිසාද සැබෑව දැන ගැනීම ලැබුවායින් පසු අපි කැමැත්තෙන්ම පව් කරමු නම්, විනිශ්චය ගැනත් විරුද්ධකාරයින් දවා දමන්නට තිබෙන උදහස් ගින්න ගැනත් භයානක බලා සිටීමක් මිස තවත් පව් ගැන පූජාවක් ඉතිරිව නැත" (හෙබ්‍රෙව් 10:26-27).**

අපත් මෙය සිතට ගත යුතු කාරණාවක් වන අතර වර්තමාන සමාජයේ බොරුව, වංචාව සහ පාපය සාධාරණීකරණය කරන මානසිකත්වයක් පවතී. එහෙත් තම ජීවිතය පූජා කර තම රුධිරය වගුරුවා අප මිලදී ගත්තා වූ යේසුස්වහන්සේ වන අප ස්වාමින්වහන්සේ උදෙසා සත්‍යවාදී, අවංක, අව්‍යාජ, පිරිසිදු, කැපවූ ස්ත්‍රීන් පුරුෂයන් ලෙස ජීවත් වීම දෙවියන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වෙයි. ස්වාමී වූ යේසුස්වහන්සේ වළාකුල් මතට පැමිණ සභාව ඔසවා ගැනීමට ආසන්න පරම්පරාවක ජීවත් වන ඔබත් මමත් කෙසේ අපගේ ජීවිත ගත කළ යුතුද? එය ඔබත් මමත් ගත යුතු තීරණයකි. එම නිවැරදි තීරණය ගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබටත් මටත් උපකාර කරන සේක්වා !

**- එස්. මෙත්තානන්ද -**

# 2024 ශුද්ධ සමුළුව

| | |
|---|---|
| දිනය | සැප්තැම්බර් 14, 15, 16, 17 |
| ස්ථානය | මෙතෝදිස්ත ශ්‍රවණාගාරය - කොල්ලුපිටිය |
| ආරම්භය | 14 සෙනසුරාදා උදේ 8.00 |
| අවසානය | 17 අඟහරුවාදා දහවල් 2.00 |
| විස්තර | උදේ, දවල්, රාත්‍රී කෑම බීම, නවාතැන් පහසුකම් සපයනු ලැබේ. |

දේව වචනය ඉගැන්වීම, ගීතිකා ගායනා කිරීම, යාච්ඤා කිරීම, එලිමහන් සුභාරංචිය ප්‍රකාශ කිරීම, නමස්කාරය සමඟ රොටි කැඩීමේ රැස්වීම,

**ඔබත් මෙම සමුළුවට සහභාගී වීමට කැමති නම් ලිපියක් මඟින් අපට ඔබගේ විස්තර දන්වන්න**

නම, දුරකථන අංකය, ලිපිනය, පැමිණෙන ගණන, පැමිණෙන දිනය

නවාතැන් පහසුකම් අවශ්‍යද? හදිසියකදී දැනුම් දීමට ඥාති දෙදෙනෙකුගේ නම

සහ දුරකථන අංක සඳහන් කර අපට ලිපියක් එවන්න


## ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය

අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com